# හක්බෙලිකන්ද ප්‍රාග් ඓතිහාසික ස්ථානය පිළිබඳ ගවේෂණාත්මක හෙළිදරව්ව.

ඒ.පී.පී. ශ්‍රියානි
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ මගින් ස්ථාන 100 ට වැඩි සංඛ්‍යාවක් පිළිබඳ වාර්තාවී ඇතත් අන්තර් දේශගුණික කලාපය තුළ මේ පර්යේෂණ අවම මට්ටමක පවතී. හක්බෙලිකන්ද ප්‍රාග් ඓතිහාසික ස්ථානය මෙම කලාපයේ තදාසන්න ප්‍රදේශයකදී හඳුනාගත් වැදගත් ස්ථානයක් වන්නේ එබැවිනි. මේ ප්‍රදේශය තුළ ප්‍රාග් මානව ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම මෙහි අරමුණ වේ.

හක්බෙලිකන්ද, අලව්ව නගරයට නුදුරින් පිහිටි පාෂාණාමය උද්ගතයක් සහිත කඳු ප්‍රදේශයකි. මෙහි මුදුන් ප්‍රදේශයේ පොකුරු ගුහා ලෙස හඳුනාගත හැකි ගුහා විසිරීමක් දක්නට ලැබේ. නැගෙනහිරට මුහුණලා එක් ගුහාවකුත් ගිණිකොණට මුහුණලා ගුහා දෙකකුත් පොකුරට ඒකරාශී වී ඇත. නැගෙනහිර ගුහාව පුළුල් ලෙස විවෘත වූ මුවවිටකින් යුක්ත වේ. එහි ගුහාව ඇතුලත සහ ඉදිරිපස අතිවිශාල ප්‍රමාණයක තිරුවානා පතුරු විසිරීමකි. මේවායේ ස්වභාවය සහ සංඛ්‍යාව අනුව ගල් ආයුධ නිපදවීමේදී ඉවත් කළ කොටස්ය.

ගිනිකොණට පිහිටි ගුහා ද්වය ඇතුල්වීමට කුඩා පිවිසුම් දෙකක් සහිත මීටර් 8-10 ක් පමණ දිගින් යුක්ත ඒවාය. සම්පූර්ණයෙන් ම පර්වතවලින් ආවරණය වූ මෙහි ඇතුලත ඝන අන්ධකාරයෙන් යුක්තය. නමුත් ගුහා ද්වාරයෙන් ලැබෙන දිවා ආලෝකයෙන් යම් එළියක් ලැබේ. ගෙබිම අවසාදිතවලින් පිරී ඇති අතර සැලකිය යුතු සාධක කිසිවක් මතුපිටින් නොලැබේ. නමුත් ගුහා ද්වයේම ඇතුල් පාර්ශ්වයේ කොටන ලද චිත්‍රය නිරූපණ ප්‍රබල සාධකයෝය. මේවා යම් ආයුධයකින් කැපීමෙන් හෝ සූරා දැමීමෙන් අර්ධ උන්නත කැටයම් ලෙස මතුකර තිබේ. සංකේත හා මානව රූප ලෙස හඳුනාගත හැකි මේ සටහන්වලට සමාන නිර්මාණ ලෝකයේ විවිධ ස්ථානවලින් හමුවී ඇත. සෙල් සිත්තම් හෙවත් Rock Art ලෙස මේවා හඳුන්වනු ලැබේ.

සමස්තයක් වශයෙන් හක්බෙලිකන්ද ප්‍රාග් ඓතිහාසික ස්ථානය වාසස්ථානයක් ලෙස සහ ආයුධ නිපද වූ ස්ථානයක් ලෙස භාවිත වී ඇත. කිසිදු අවුල්වීමකින් තොරව පවතින මේ ස්ථාන ක්‍රමානුකූල කැණීමකට භාජනය කිරීමෙන් නියත වශයෙන්ම වැදගත් තොරතුරු අනාවරණය කරගත හැකිය. මෙහි ජීවත්වූවන්ගේ ආහාර රටාව, ශාරීරික ස්වරූපයන් යනාදිය එයින් එළිදරව් කරගත හැකි බව විශ්වාස කළ හැකිවේ. හක්බෙලිකන්ද පාමුල පිහිටි මෙවැනි ගුහා රාශියක් ශිලා ලිපි සහිත කටාරම් ලෙන් වාසස්ථාන බවට පරිවර්තනය වී ඇතත් උස් මට්ටමේ පිහිටි මේ ගුහාවල පරිවර්තන අවධියක සලකුණුකුදු නොපෙන්වයි. ඒවා වෙත ළඟා වීමට ඇති දුෂ්කරතාවය මෙම ගුහා ආරක්ෂා වීමට හේතු වී තිබේ. නමුත් මෑතක සිට ගුහා ආශ්‍රිත කඳු මුදුනට ඇතැම් පිරිස් යන බවට සලකුණු ඉතිරිව ඇත. මේ ගුහා ඇතුලත මෑතක දල්වන ලද ගිනිමැල, බිඳුනු වීදුරු බෝතල් කැබලි සහ බිස්කට් කවර විසිරී තිබේ. හක්බෙලිකන්ද හැරුනු විට තදාශ්‍රිත බඹරගල ඇතුළු ස්ථාන රාශියක් ප්‍රාග් ඓතිහාසික ස්ථාන ලෙස අනාවරණය වී ඇත. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේශන කණ්ඩායම වාර්තා කරන අකාරයට මේ ප්‍රදේශයේ එක් ග්‍රාමසේවා කොට්ඨාශයකට අවම වශයෙන් ප්‍රාග් ඓතිහාසික ස්ථාන දෙකක්වත් හඳුනාගත හැකිය.